“නැණ සයුර” අධ්‍යාපනික වැඩසටහන -2022

සරසවි පිවිසුම් අත්වැල

උතුරුමැද පළාත් දෙපාර්තමේන්තුව

| 29 | S | I |
|---|---|---|

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

13 ශ්‍රේණිය

කාලය පැය 02

# පිළිතුරු පත්‍රය

## A කොටස

01. 03
02. 01
03. 03
04. 03
05. 01
06. 01
07. 03
08. 05
09. 02
10. 03
11. 04
12. 04
13. 03
14. 05
15. 02
16. 05
17. 03
18. 02
19. 03
20. 01
21. 03
22. 05
23. 02
24. 02
25. 03

26. 03
27. 01
28. 03
29. 04
30. 02
31. 04
32. 03
33. 01
34. 01
35. 04
36. 05
37. 03
38. 03
39. 03
40. 02
41. 04
42. 02
43. 03
44. 03
45. 04
46. 02
47. 05
48. 02
49. 03
50. 02

"නැණ සයුර" අධ්‍යාපනික වැඩසටහන -2022

සරසවි පිවිසුම් අත්වැල

උතුරුමැද පළාත් දෙපාර්තමේන්තුව

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

| 29 | S | II |
|---|---|---|

13 ශ්‍රේණිය

කාලය පැය 03

# පිළිතුරු පත්‍රය

01. I

- ❖ රේඛීය නොවන චක්‍රීය සන්නිවේදන ආකෘතියකි.
- ❖ සන්නිවේදකයාසේම ග්‍රාහකයා ද සන්නිවේදනයට වැදගත් වේ.
- ❖ ආකේතකරණය , විකේතකරණය , අර්ථකථනය යන අවස්ථා පැහැදිලි කිරීම , සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියක් බව
- ❖ ප්‍රතිපෝෂණය යන්න ද මෙයට අන්තර්ගත කර තිබේ.

II. කිසියම් භාෂාවක පවතින ශබ්ද රටා සහ වචන රටා භාවිතා කරමින් සිදු කරන සන්නිවේදනය වාචික සන්නිවේදනයයි.

කාර්යය

- ➢ ඉගැන්වීම,උපදෙස් දීම හා මඟ පෙන්වීම .
- ➢ පුද්ගලයන් අතර තොරතුරු හුවමාරුව.
- ➢ මානව සම්බන්ධතා පවත්වා ගැනීම.
- ➢ සිතෙහි ඇතිවන භාවයන් ප්‍රකාශයට පත් කිරීම.
- ➢ පුද්ගල පෞරුෂය ඇති කිරීම හා විවිධ කාර්යන් ඉටුකර ගැනීම.

III. **භාෂණය** - බොහෝ විට නිශ්චිත පිටපතක් ඇති ව හෝ නැතිව කරනු ලබන තොරතුරු ඉදිරිපත් කිරීමක් ලෙස හැඳින්විය හැකි ය.සංවාද , සම්මුඛ සාකච්ඡා මෙයට අයත් වේ. භාෂණයේදී කෙටි වාක්‍ය භාවිත කිරීම ඉතා වැදගත් ය. ග්‍රාහකයාට වැටහෙන ආකාරයෙන් ඉදිරිපත් කළ යුතු ය. අඩු වචන සංඛ්‍යාවකින් වැඩි දෙයක් කතා කිරීම මෙහි අපේක්ෂාවයි.

**රූපණය** - පුද්ගලයා තුළ චිත්ත රූප මැවෙන ආකාරයෙන් යමක් ඉදිරිපත් කිරීම, ශබ්ද , හඬ, සංගීත ආදිය මෙන්ම නිශ්ශබ්දතාවය තුළින් ද මෙය කළ හැකි ය. පරිසරයේ සිදුවන විවිධ වෙනස්කම් ආදිය මේ මඟින් දැක්වීම කළ හැකි ය.රාත්‍රී කාලයෙහි සිටින සතුන්ගේ ශබ්ද ඇති කිරීම මඟින් රූපණය සිදු කෙරේ. මෙය බොහෝ විට දක්නට ලැබෙන්නේ ගුවන්විදුලි නාට්‍ය තුළය. මිනිස් හඬ, වයස ස්ත්‍රී-පුරුෂභාවය,ඌකියාව ,ජීවත් වන ප්‍රදේශය ,සංස්කෘතිය ,මුහුණ දෙන සමාජ අවස්ථාවලට අනුව විවිධ ස්වරූප ගනී. එසේම සංගීතය ජන සංගීතය, ශාස්ත්‍රීය සංගීතය ආදි විවිධ වේ. මිහින්තලයේ පවතින සියලු ශබ්ද ගුවන්විදුලි භාෂාවට අයත් ය.

IV.

- ➢ සරල භාෂාවක් විය යුතු ය.
- ➢ කෙටි වැකි තිබිය යුතු ය.
- ➢ විදග්ධ භාෂාවක් නොවිය යුතු ය.

- උප භාෂා /ප්‍රාදේශීය භාෂා හැකිතාක් අඩු කළ යුතු ය.
- පාරිභාෂික වචන අඩු වීම.
- සංඛ්‍යා දත්ත ඉදිරිපත් කිරීමේදී පැහැදිලි විය යුතු ය.

මින් 04ක් පැහැදිලි කළ යුතු ය.

02. I.

- සෑම සමාජ පන්තියක් ම ආකර්ෂණය කර ගැනීම.
- මහ පරිමාණ ලෙස නිෂ්පාදනය බෙදා හැරීමක් පවතී.
- වානිජත්වය සමඟ බැඳී පවතී.
- ශ්‍රමිකයින් තුළ ඉක්මනින් ප්‍රචලිත වීම.
- කල්පවතින ස්වභාවයක් නොමැති වීම.
- ජන මාධ්‍ය මත ව්‍යාප්තිය සිදු වීම.
- සෑම විටම කාලීන තත්ත්වයන් මත ගොඩනැඟීම.

II.

- නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීම.
- මිල ගණන් පිළිබඳ අවබෝධයක් ලබා දීම.
- කාලය ඉතිරි කරගත හැකි වීම.
- දෛනික ජීවිතයට පහසුවක් වීම.
- සමාජ අවශ්‍යතා ඉටු කිරීම.
- ව්‍යාපාරික අවශ්‍යතා ඉටු කිරීම.
- සමාජ චර්යා වෙනස් කිරීමට හේතු වීම.

මින් හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න.

III.

- අදාළ රූප රාමුවලට උචිත ලෙස භාෂාව යොදා ගැනීම.
- සරල භාෂාවක් යොදා ගැනීම.
- රූපයට ප්‍රමුඛත්වය දී අඩුවෙන් භාෂාව යොදා ගැනීම.
- ග්‍රාහක ස්වභාවය අනුව භාෂාව වෙනස් වීම.
- වැඩසටහන අනුව භාෂාව වෙනස් වීම.
- නිවැරදි උච්චාරණය
- නිවැරදි භාෂාව යොදා ගැනීම.

මින් තුනක් පැහැදිලි කළ යුතු ය.

IV. විවිධ වැදගත් දේ සම්බන්ධයෙන් දැනුම, අවබෝධය ලබා දීම ,නිරන්තරයෙන් ,පරිසරය පිළිබඳ ව අවදියෙන් සිටිමට හැකි වීම, විවිධ මතවාදයන් ගොඩනැඟීම, සංස්කෘතිය අඛණ්ඩව රැක ගැනීමට හැකි වීමට උපකාරී වීම., විවිධ ආපදා හා ව්‍යවසායන් පිළිබඳව පූර්ව දැනුම් දීම, දෛනික ජීවිතයේ විධිමත්භාවය සඳහා උපකාරී වීම, තොරතුරු අලෙවි කළ හැකි දෙයක් බවට පත් ව තිබීම , ජන විඥානය පුළුල් කිරීම.

03. I.

- ජන කතා
- ජනගී/ ජන ගායනා/ආගම්/ඇදහිලි/විශ්වාස
- ජන ක්‍රීඩා
- යාතු කර්ම
- ජන රංග
- ප්‍රස්තාව පිරුළු
- තේරවිලි

- ජන වෙදගම

II. ප්‍රශ්නාවලියක් මඟින් ,සම්මුඛ සාකච්ඡා මඟින් නිරික්ෂණ ක්‍රමය, සහභාගීත්ව නිරීක්ෂණය මඟින් ,ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයනය (මින් දෙකක් කෙටියෙන් විස්තර කරන්න)

III.

- පොදු ජනතාවට සමීප සංකේත ,සංදර්භ ආදියෙන් යුක්ත වීම.
- විවිධ සංස්කෘතිකාංග ආරක්ෂා කර ගැනීමට හැකි වීම.
- පැරණි සංස්කෘතිකාංග ආරක්ෂා කර ගැනීමට හැකි වීම.
- නිර්මාණාත්මක චින්තනයක් ගොඩනගා ගත හැකි වීම.
- සර්වකාලීන වශයෙන් රස විඳිමේ හැකියාව
- සංස්කෘතික උරුමයන් පරපුරෙන් පරපුරට පවරා දීමේ හැකියාව

  මින් කරුණු තුනක් පැහැදිලි කළ යුතු ය.

IV.**සංස්ලේෂණ හා විශ්ලේෂණ ප්‍රවේශය**

සෞන්දර්යාත්මක ප්‍රවේශය, භාෂාත්මක ප්‍රවේශය , සදාචාරාත්මක ප්‍රවේශය ,දේශපාලනික ප්‍රවේශය ,නිර්මාණාත්මක ප්‍රවේශය ඓතිහාසික ප්‍රවේශය

භාෂාත්මක ප්‍රවේශය- භාෂාත්මක ප්‍රවේශය යටතේ ජනශ්‍රැතිවල පවතින භාෂාවන් විචාරයට ලක් කළ හැකි ය. විවිධ ජන කතා ,ජන ගීවල පවතින භාෂාව ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. එම භාෂා තුළ තිබෙන වචන අර්ථ ගන්වනු ලබන්නේ විවිධා කාරයෙනි. එසේම භාෂාව කර්මාන්තයට වෙනස් වීම පුවාශේෂි ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකි ය.

**සෞන්දර්යාත්මක ප්‍රවේශය**

සෞන්දර්යාත්මක අතින් ගත් කල මෙම ජනශ්‍රැති විවිධ කොණයන්ගෙන් බැලිය හැකි වීම තවත් විශේතාවයකි.සමහර ජන නැටුම්, නාට්‍ය පිරිමි පමණක් යොදා ගනිමින් රඟ දක්වයි. එහි ගැහැණු චරිත නිරූපණය කරන්නේද පිරිමින් විසිනි. එහිදී ගැහැණිය තුළ පවතින ලාලිත්‍ය හොඳින් ඉස්මතු කර පෙන්වයි. මෙයට කදිම නිදසුනකි, සොකරි නාට්‍යයය. එහි සියලු චරිත නිරූපණය වන්නේ පුරුෂ පක්ෂය අතිනි. සොකරි චරිතයට පවා පණ පොවනු ලබන්නේ පුරුෂයෙකි.

**නිර්මාණාත්මක ප්‍රවේශය.**

එසේම නිර්මාණාත්මක ප්‍රවේශය තුලින් ද ජනශ්‍රැති විචාරයට ලක් කළ හැක. එයට වන්නම් කදිම නිදර්ශනයකි. සතුන්ගේ විවිධ අංග චලන ආශ්‍රිතව වන්නම් වල කවි නිර්මාණය වී ඇත. එය බිහි වී ඇත්තේ විවිධ වූ සත්ත්වයන්ට අනුකූලව ආරෝපිත කර ගත් කවිවලිනි. එහි තාල යොදා ඇත්තේ ද සත්ත්වයින් හැසිරෙන,ගමන් විලාසයන් අනුව ය. ගඩගා වන්නමේදි ඇත් ගමනට අනුවද එහි කවි හා තාල යොදා ගෙන ඇත.

**සදාචාරාත්මක ප්‍රවේශය**

සදාචාරාත්මක ප්‍රවේශයට අනුවද ජනශ්‍රැති විචාරයට ලක් කළ හැකි ය. නිදසුනක් ලෙස කමතේදී පෙන්වන නාට්‍යවලදී පළමුව කරනු ලබන්නේ දෙවියන්ගේ අවසර ගැනීමයි. එසේම හේනක් ගිනි තබන අවස්ථාවලදී ද එහි සිටින සියලුම සතුන්ට ඉවත්වන ලෙස ආයාචනා කරනු

ලබයි. එසේ සිදු කරනු ලබන්නේ සත්ත්වයින්ටද මෙම මහ පොළව තුළ ජීවත් වීමට අයිතියක් තිබෙන හෙයිනි.

04. ජන මාධ්‍ය සමාජයට ඉටු කරන කාර්යයන් රැසකි.

01. තොරතුරු සම්පාදනය මූලික වශයෙන් ජනමාධ්‍ය සිදු කරන්නේ තොරතුරු සම්පාදනයකි. මෙම තොරතුරු බොහෝමයක් ජනතාවගේ ආරක්ෂාවට පැවැත්මට අවශ්‍ය කරන තොරතුරු ය.

02. අධ්‍යාපනය ලබා දීම .
සමාජය වඩාත් යහපත් කිරීමට අවශ්‍ය කරන අධ්‍යාපනය ලබා දීමට ජන මාධ්‍ය මැදිහත්ව ක්‍රියාත්මක වේ. ජනමාධ්‍ය යනු අවිධිමත් අධ්‍යයන අවස්ථා ලබා දෙන ව්‍යුහයකි.

03. සමාජ ඒකාබද්ධතාව
පුළුල් සමාජයක් යනු විශාල භූමි ප්‍රදේශයක විසිරි සිටින ජන කණ්ඩායමකි. ඔවුන් ආගමිකව , වාර්ගිකව වෘත්තිමව යනාදි වශයෙන් විවිධ වේ.
සමාජයක පැවැත්ම සඳහා මේ එකිනෙකාගේ අන්‍යෝන්‍ය පැවැත්ම සහතික වීම අවශ්‍ය වේ. මෙම කාර්ය ඉටු කරන්නේ ජන මාධ්‍ය මඟිනි.

04. පෙළඹවීමේ කාර්ය
සමාජය එක්තැනකදී රැඳි සිටින්නක් නොවේ. එය නිරන්තරයෙන් ගතිකව වෙනස් වේ. එහිදී සමාජයේ සියල්ලන් අපේක්ෂිත දිසාවකට ගමන් කිරීම සඳහා පෙළඹීම අවශ්‍ය වේ.
දැන්වීම්කරණය තුළ සිදු කරනු ලබන්නේ කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් ලබා ගැනීම සඳහා පෙළඹවීමකි.

II.

- ❖ ආචාරධර්ම පැනවීම.
- ❖ මාධ්‍ය සාක්ෂරතාව
- ❖ විචාරශීලි ග්‍රාහකත්වය වැඩි දියුණු කිරීම.
- ❖ ග්‍රාහක සමාජ බිහි කිරීම.
- ❖ ආයතන වසා දැමීම හෝ පවත්වාගෙන යාම පිළිබඳ තහංචි හෝ සීමා පැනවීම
- ❖ උද්ඝෝෂණ කිරීම.

01. විචාරශීලි වීම

විචාරශීලි ග්‍රාහකයෙකු බවට පත්වීම තුළින් මාධ්‍ය ප්‍රචණ්ඩත්වයෙය් බලපෑම අවම කරගත හැකි ය. මන්ද ග්‍රාහකයා සෑම විටම විවිධ වූ මාධ්‍ය පරිහරණය කරන නිසාත්, සමාජය පිළිබඳ හොඳ දැනුවත් භාවයකින් යුක්ත නිසාත් විචක්ෂණශීලිව කරුණු දෙස බැලීමේ හැකියාව ඔහු සතුව ඇත. ඒ අනුව මාධ්‍යයන් හා සන්දේශ හඳුනා ගැනීම මඟින් ජනමාධ්‍ය ප්‍රචණ්ඩත්වය හඳුනාගැනීමට එම ග්‍රාහකයන්ට හැකියාවක් ඇත. ජනමාධ්‍ය මඟින් සඟවන දේ නිසි ලෙස අවබෝධ කර ගැනීමේ හැකියාව ද විචාරශීලි ග්‍රාහකයාට ඇත. මේ නිසාම ජනමාධ්‍ය මඟින් කුමක් ප්‍රචාරය වුවත්තමන්ට අවශ්‍ය දේ පමණක් තෝරා ගැනීමට ඔහු පෙළඹේ.

02. මාධ්‍ය සාක්ෂරතාව

මාධ්‍යන් තුල විකාශනය වන වැඩසටහන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙයින් සිදුවනු ලබයි. වැඩසටහන් මඟින් ව්‍යංගාර්ථවත් දේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා විවිධ වූ ප්‍රකාශන ඉදිරිපත් වන අතර ම විවිධ වෙළෙඳ දැන්වීම් මඟින් ද ඒ පිළිබඳව ජනතාව දැනුවත් කරනු ලබයි.

III. රූපවාහිනිය මාධ්‍ය ඇසුරෙන්

1. පාරිභෝගික සංස්කෘතියක් ඇති කිරීම.
2. ගෝලීය ජනප්‍රිය සංස්කෘතිය ව්‍යාප්ත කිරීම.
3. ගෝලීය මාධ්‍ය ආකෘති යොදා ගැනීම.
4. චිත්‍රපට ,ටෙලිනාට්‍යවල තාක්ෂණය විසින් ගොඩනැගූ වීර චරිත ජනප්‍රිය වීම, සැබෑ වීරයන් ගිලිහි යාම.
5. ගෝලීය නාලිකා ප්‍රදේශීකරණයට ලක් වීම.
6. උසස් තාක්ෂණයෙන් යුක්ත මාධ්‍ය නාලිකා සමඟ තරඟ කිරීමට නොහැකි වීම.
7. සමකාලීන මානව සංස්කෘතියේ පවතින නිර්මාණ ගෝලිය සංස්කෘතියේ පවතින නිෂ්පාදන මඟින් යටපත් වීම.
8. බහු භාණ්ඩකරණයට ලක් වීම.
9. අධ්‍යාත්මික සංස්කෘතිය ඉවත් වී භෞතික සංස්කෘතිය ඉස්මතු වීම.
10. මානව සබඳතා යාන්ත්‍රිකරණය වීම.
11. විනෝදාස්වාද සම්පාදනය ප්‍රබල වීම.
12. මානවයා හුදකලා පුද්ගලයෙකු බවට පත් කිරීම.
    මෙම කරුණු ඇසුරෙන් පැහැදිලි කළ යුතු යි.

IV මාධ්‍ය නියාමනය රටක පැවැත්මට සුවිශේෂ කාර්යන් රැසක් ඉටු කරයි. මාධ්‍ය මඟින් ගලායන තොරතුරු රාජ්‍යයටද එහි වසන සියලු මිනිසුන්ට සහ ඇතැම් විටක ජීවි අජීවි අනෙක් වස්තූන්ටද බලපෑම් එල්ල කරයි. එම නිසාම මාධ්‍ය නියාමනය සමාජයට බලපාන ආකාර කීපයක් මෙසේ විස්තර කළ හැකි ය.

ජාතික ආරක්ෂාව පවත්වා ගැනීමේ දී ඇතැම් සංවේදී තොරතුරු නිදහසේ සමාජයට ගලායැම් හෝ විකෘති හෝ වානිජ තොරතුරු ප්‍රකාශ කිරීම අයහපත් බලපෑම් එල්ල කරයි. රාජ්‍යයට අදාළ වන නීති රීති ඔස්සේ එම තත්ත්වයන්ට මැදිහත් වීම නියාමනයේදී සිදුවන බැවින් අගතීන්ට පත්වීම් වලක්වා ගත හැකි ය. මහජන සාමය, ආරක්ෂාව හා සුභසිද්ධිය පවත්වා ගැනීමේ දී ද සංවේදී ව්‍යාජ හෝ විකෘති කරන ලද තොරතුරු ඉතා බරපතල ගැටුම් සහ ගැටුම් නිර්මාණය වීමට හේතු වේ. නියාමය තුළින් මේවා කළමනාකරණය කළ හැකිය. පුද්ගල නිදහස නිදහස් සමාජය තුල තහවුරු කරනු ලැබේ. එහෙත් ඇතැම් තොරතුරු නිසා ඇතැම් පුද්ගලයෙකුගේ නිදහස උල්ලංඝනය විය හැකිය. එම තත්ත්වයන් පාලනය කිරීමට නීති රීති හා ආචාර ධර්ම සොයා බැලීමට නියාමනයේදී සිදු වේ. තොරතුරු නිවැරදි හා සාධාරණ වීම සමාජයට යහපතක් වන්නා සේම සාවද්‍ය සහ අයුක්ති සහගත තොරතුරු විකෘති ඇති කරවයි.

මේ නිසා තොරතුරු නිවැරදිව සහ සාධාරණව මාධ්‍ය තුළින් ගලා යන්නේද යන්න නියාමය විසින් සිදු කරනු ලැබේ.

මීට අමතරව නියාමනය සමාජයට බලපාන තවත් ආකාර රැසක් හඳුනාගත හැකි වේ.

05. I.

- අන්තර්ජාලය උපයෝගි කර ගනිමින් ඡායා රූප උඩුගත කිරීම.
- කෙටි පණිවිඩ මඟින්
- මුහුණු පොත හරහා ප්‍රතිචාර ලබා දීම.
- විද්‍යුත් තැපැල හරහා තොරතුරු ලබා දීම.

II.

- කොළ අතු එල්ලීම.

බෝවන රෝගයක් ඇති නිවසේ ඉදිරිපස කොහොඹ කොළ අතු එල්ලීම සිදු කරයි. එවිට ප්‍රදේශයේ අනෙකුත් මිනිසුන් ඒ පිළිබඳ අවබෝධයෙන් එම අසනීප වු පිරිසට අවශ්‍ය ආහාර පාන වෙනත් දේ,ඖෂධ වැනි ද්‍රව්‍ය නිවස ඉදිරිපිටින් තැබීම සිදු කරයි.

- යාතු කර්ම.


යාතු කර්ම පුරාණෝක්ති ජන ඇදහිලි සම්බන්ධ තවත් ජනශ්‍රැති ප්‍රභේදයකි. ග්‍රහදෝෂ ඇති කරනු ලබන්නේ යැයි විශ්වාස කරනු ලබන විවිධ ලෙඩ රෝග විපත්වලින් මුදා ගැනීමටත් පැරණි ගැමියෝ යාතු කර්ම පැවැත් වු බවට ප්‍රකට ය.

III.


- වසංගතයේ ස්වරූපය පැතිරි යන ආකාරය පිළිබඳ නිතර නිතර දැනුවත් කිරීම.
- රෝගයෙන් ආරක්ෂා විය හැකි ක්‍රම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.
- රෝගය වැළදුනු කෙනෙකුට ප්‍රතිකාර කළ යුතු ආකාරය දැනුවත් කිරීම.
- වෙළෙඳ දැන්වීම් මඟින් ,කාටුන් මඟින් ජනතාව දැනුවත් කිරීම.
- ටෙලිනාට්‍ය, කෙටි චිත්‍රපට වැනි නිර්මාණවලින් රෝගය පිළිබඳදැනුවත් කිරීම.
  (උදාහරණ සමඟ විස්තර කළ යුතු ය.)

IV. ටෙලිනාට්‍ය ,ගීත, වෙළෙඳ දැන්වීම්,චිත්‍රපට වැනි නිර්මාණ අතුරින් පැහැදිලි කළ යුතු ය.

06. පාසල් දරුවන්ගේ රූපවාහිනිය නැරඹීමේ ලැදියාව



පිරිමි දරුවන්



ගැහැණු දරුවන්

II. ඉහත නියැදිය සමස්ත රටේ ළමුන්ගේ රූපවාහිනිය ලැදියාව හඳුනා ගැනීම සඳහා වඩා පොදු නියැදියක් ලෙස භාවිත කිරීම විශ්වසනීය නොවේ. ඒ සඳහා ඉදිරිපත් කළ හැකි හේතු කිපයකි.

- 10 ශ්‍රේණිය ළමුන් පැදියාව ඔස්සේ සමස්ත ළමා ප්‍රජාවගේම රූපවාහිනිය ලැදියාවන් තක්සේරු කළ හැකි නොවේ. 10 ශ්‍රේණියට පහළ ශ්‍රේණි කාණ්ඩයේ රූපවාහිනි ලැදියාවන් සපුරා වෙනස් විය හැකි ය.
- මෙම පාසල ග්‍රාමීය හෝ නාගරික පාසල් අනුව එම නියැදිය සමස්ත ළමා ප්‍රජාවම ආදේශ කළ නොහැකි ය. ග්‍රාමීය නාගරික වශයෙන් ළමා ප්‍රජාවන්ගේ රූපවාහිනිය නැරඹීමේ ලැදියාවන් වෙනස් විය හැකිය. ඒ අනුව මෙම දත්ත සමස්ත රටේ දරුවන්ගේ රූපවාහිනි නැරඹීමේ ලැදියාව තේරුම් ගැනීමට ප්‍රමාණවත් නොවිය හැකි ය.

III.

1. ගැටලුව හඳුනා ගැනීම.
2. අරමුණු හඳුනා ගැනීම.
3. මාතෘකාව තීරණය කිරීම.
4. දත්ත රැස් කිරීම.
5. දත්ත විශ්ලේෂණය කිරීම.
6. නියාමනය
7. වාර්තා ලිවීම

උදාහරණ සපයමින් විස්තර කළ යුතු ය.

IV.

- ග්‍රාහක ලැදියාව පිළිබඳ මාධ්‍ය සමීක්ෂණයක් තුළින් මාධ්‍ය ආයතනයකට වඩා සුවිශේෂ ප්‍රතියෝජනයක් ලබා ගත හැකි වේ. තම වැඩසටහනෙන් අන්තර්ගතයන් සැලසුම් කිරීමේදී හා ප්‍රවර්ධනය කිරීමේ දී එම තොරතුරු සැලකිල්ලට ගත හැකි ය.

- ග්‍රාහක ලැදියාවන් හඳුනාගැනීමට ඉඩකඩ ලැබීම තුළින් ග්‍රාහකයාට වඩාත් සමීප මාධ්‍ය සංදේශ සම්පාදනයට එම ආයතනවලට ඉඩකඩ ලබා ගත හැකි ය.

- ග්‍රාහක ලැදියාව වඩා ශාස්ත්‍රීය ප්‍රතිපෝෂණයක් බවට පත් කරගත හැකි ය. එහිදී තම වැඩසටහන් සැලසුම් සංශෝදනයකට හෝ ප්‍රතිසංවිධානයකට අවස්ථාව සලසා ගත හැකි වේ. ඇතැම් විට තම ආයතනයේ මාධ්‍ය ක්‍රියාවලියේ සිදු වන යම් යම් අඩුපාඩු දෙස ආපසු හැරී බලන්නට මෙමඟින් හැකි වේ.

- ඇතැම් විටෙක නව මාධ්‍ය භාවිතයන් ජනතාව අතර ප්‍රචලිත වී ඇති අවස්ථා හඳුනාගත හැකි වේ. එසේම වඩා ප්‍රචලිත වී ඇත්නම් ඊට හේතු සාධක ද හඳුනා ගැනීමට යොමු විය හැකි ය. අදාළ මාධ්‍ය ජනතාව අතරට ගෙන යා යුතු නම් හෝ ජන ආකර්ශණය ඉහළින් ම පවත්වාගත යුතු වේ. ඒ සඳහා වන උපාය මාර්ග වෙත යොමු වීමට ඉඩකඩ ලැබේ.

07 I. මාධ්‍ය නියාමනය යනු රටක පිළිගත් නීති , මාධ්‍ය ආචාර ධර්ම , ප්‍රතිපත්ති සහ වටිනාකම්වලට අනුව මාධ්‍ය ක්‍රියාකරන්නේ ද යන්න සොයා බලමින් එම ක්‍රියාවලින් නිවැරදි කිරීමට ගන්නා විවිධ මැදිහත්වීම් ඇතුළත් ක්‍රියාවලියයි.

II.

- ස්වයං නියාමනය
- සහනියාමනය
- ව්‍යවස්ථාපිත නියාමනය

❖ අභ්‍යන්තරික නියාමනය
(මින් 2ක් පැහැදිලි කළ යුතු ය.)

III. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන මාධ්‍ය නියාමන ආයතන කීපයක් හඳුනා ගත හැකි ය.

01. රැගුම් පාලක මණ්ඩලය
චිත්‍රපට නාට්‍ය වැනි ප්‍රායෝගික කලාවන් නියාමනයට ලක් නිරීම මෙහිදි සිදු වේ. ඇතැම් නිර්මාණ තහනම් කිරීමද ,සංශෝධනයට ලක් කිරීමට යොමු කිරීමද වර්ගීකරණයට ලක් කිරීමටද අනුමත කිරීම ද මෙම ආයතන මඟින් සිදු වේ. නාට්‍යයක් හෝ චිත්‍රපටයක් ප්‍රසිද්ධ මහජන ප්‍රදර්ශනයට ඉදිරිපත් කිරීමට හෝ මෙම අනුමැති සහතිකය ලබා ගත යුතු වේ. රැගුම් පාලක මණ්ඩලය තුළ සාමාජිකත්වය දරන්නේ සිවිල් සමාජය නියෝජනය කරන විද්වත් මණ්ඩලයකි.

02. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මෙමගින් ගුවන් විදුලි සහ රූපවාහිනි මාධ්‍ය විකාශනයන් නියාමනයට ලක් කරනු ලැබේ. අදාළ ගුවන් විදුලි හෝ රූපවාහිනි නාලිකා සඳහා බලපත්‍ර ලබා දීම මෙන්ම අවලංගු කිරීම සඳහා ද බලතල මෙම ආයතනය සතු ය. අනවසරයෙන් ගුවන්විදුලිය හෝ රූපවාහිනි විකාශයන් සිදු වුවහොත් ඒවා වටලා නීතිය හමුවට පැමිණීම මෙම ආයතනය මඟින් සිදු වේ. විද්‍යුත් මාධ්‍ය සඳහා ඇති ආයතන පාලනය කරනු ලබන්නේ මෙම ආයතනය විසිනි.

03. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
පුවත්පත් මාධ්‍ය තුළින් සිය පුද්ගල නිදහසට අදාළව ඉදිරිපත්වන පැමිණිලි පිළිබඳ සොයා බලමින් පුවත්පත්වල සංදේශ කාර්ය නියාමනයට ලක් කිරීම මෙමගින් සිදු කෙරේ. අගතියට පත්වන පාර්ශවයට යුත්තිය ඉටුකර දීමට මැදිහත් වීම මෙම ආයතනයෙන් සිදු වේ.

04. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය
පරිගණකය හා බැඳුණු අන්තර්ජාල ක්ෂේත්‍රයේ සිදුවන උල්ලංඝනය වීම සොයා බලමින් නියාමනයට ලක් කිරීම මෙමගින් සිදු වේ. විශේෂයෙන්ම සමාජ මාධ්‍ය තුළ සිදුවන විවිධාකාර අවභාවිතාවන් නිවැරදි කිරීම සඳහා බලය ලත් ආයතනයකි.

IV. මාධ්‍ය නියාමනය රටක පැවැත්මට සුවිශේෂ කාර්යයන් රැසක් ඉටු කරයි. මාධ්‍ය මඟින් ගලායන තොරතුරු රාජ්‍යයටද එහි වසන සියලු මිනිසුන්ට සහ ඇතැම් විටක ජීවි අජීවි අනෙක් වස්තූන්ටද බලපෑම් එල්ල කරයි. එම නිසා මාධ්‍ය නියාමනය සමාජයට බලපාන ආකාර කීපයක් විස්තර කළ හැකි ය.